

ලක්ෂ්මන් කොඩිතුවක්කු

# ඡන්දේ දෙන්නේ කාටද?




"පුරුෂාධිපත්‍යය කියන්නේ මොකක්ද බන් ?" රජයේ මුද්‍රණ සංස්ථාවේ සේවය කරන කාලයේ මගෙන් එසේ ඇසුවේ පුරුෂයෙකි. කිසිදු ප්‍රතිභාවක් නැති ඔහු විශ්ව විද්‍යාලයට ඇතුල්වන්නට යන්තම් ලකුණක් දෙකක් අඩු වූ විද්‍යා අංශයෙන් හොඳ දැනුමක් ලද පසුව මුද්‍රණ කර්මාන්තය පිළිබඳව ඩිප්ලෝමාවක් ද ලද පුද්ගලයෙකි. එහෙත් ඔහුට කලාව, සිංහල බස ආදිය පිළිබඳව තිබුණේ අල්ප දැනුමකි. සාමාන්‍ය පෙළදී ඔහු සිංහල බස සමත් වී තිබුණේ දැනුමට වඩා වාසනාවට කිවහොත් එය නිවැරදිය. ඔහු අධ්‍යාපනය ලද පාසලත් ලග සිටි මිතුරාත් විභාග ශාලාවේ එදා සිටි නිළධාරියාට පිං සිදුවන්නට ඔහු මව්බස සමත් වුවද ඒ බසට ඔහු දැක්වූයේ කුඩම්මාගේ සැලකිලිය. උසස් නොවූවද ඉංග්‍රීසි දැනුමෙන් තරමක් දුරට පොහොසත්ව සිටි ඔහු ඊළඟ ආත්මයේදී එංගල්නතය වැනි රටක උප්පත්තිය ලබන්නට පෙරුම් පුරාගෙන සිටි පුද්ගලයෙකි. විකල්ප පුවත්පතත්, සිනමාවත්, නාට්‍යත්, ගීතයත්, හරබර දේශපාලන සංවාදයත් ඔහුට අරහංය. නීරසය. ගෙවල්දොරවල්, ඉඩකඩං, යාන වාහන, විදේශ සංචාර පිළිබඳව වැඩිපුර කතාබහ කරන ඔහුගේ රසවත් මාතෘකා නැති තැන ඔහු හෙමින් සීරුවේ ලිස්සා ගියේය. ඒ නිසා ඔහු මට පැය අටේ මිතුරෙකු බවට පත්ව සිටියේය. අප දෙදෙනාම සේවය කළේ පෙර සැලසුම් අංශයේය. ඒ කාලයේ බොහෝ චිත්‍රපට දැන්වීම් මුද්‍රනය කළේ රාජ්‍ය මුද්‍රන සංස්ථාවේය. ඒ චිත්‍රපට සංස්ථාව හා මුද්‍රණ සංස්ථාව අතර වූ ගිවිසුමක ප්‍රතිපලයක් ලෙසිනි. හැත්තෑව අසූව දශකයේ සිනමාවේ ස්වර්ණමය යුගය යැයි හැඳින් වූ ඒ අවධියේ එක්තරා සුවිශේෂී චිත්‍රපටයක පෝස්ටරයක් ද පෙර සැලසුම් අංශයට ලැබී තිබිණි. එය දුටු විගස මගේ පැය අටේ මිතුරා කඩිනමින් දුවගෙන ආවේය. "අන්න ලකී හංස වලක් කියල ෆිල්ම් එකක පෝස්ටරයක් ඇවිල්ලා. හදිස්සිලු. හෙට වෙනකොට සෙටිඅප් කරලා මුද්‍රන අංශයට භාර දෙන්න ඕනෙලු." අද මෙන් ඩිජිටල් තාක්ෂණික උපාංග නොතිබූ ඒ අවධියේ සියල්ල සැලසුම් කළේ පුද්ගල දැනුමෙන් හා දෑතිනි. මට ඒ වනවිටත් පුවත් පත්වල සිනමා තීරු කියවා තිබූ නිසා ධර්මසිරි බණ්ඩාරනායකගේ නවතම චිත්‍රපටිය හා එහි නළු නිළියන් සේම නම පිළිබඳවද දැනුවත්ව සිටි නිසා හිතට ආවේ කුතුහලයකි. මම ආට්වර්ක් එක පෙරලා බැලුවෙමි. ධර්මසිරි, හෙන්රි, ස්වර්ණාගේ රූපරාමුවලින් ආලෝක වී තිබූ එම දැන්වීමේ "හංස විලක් " ලියා තිබුනෙත් අපූරු කලාත්මක ස්වරූපයෙනි. එහි වියන්න තුල සුවිශේෂී කලාත්මක හැඩයක් තිබුණි. කලාත්මක ඇසක් නැති ඔහු වියන්න දුටුවේ වයන්න ලෙසය. එහි කලාත්මක ස්වරූපය පිළිබඳව ඔහු දැනුවත් කරන්නට මා උත්සාහ ගත්තද එය නිසරු උත්සාහයක් බවට පත්වූයේය. සාමාන්‍ය සරල ගීතයකවත් අදහසක්, තේරුමක්, නොදන්නා පුද්ගලයෙකු සමඟ වාදයට නොයන මෙන් මගෙන් ඉල්ලා සිටියේ අකුරු ඇමුණුම් අංශයේ සිටින අල්විස් අයියා ය. ඔය මෝඩ මිනිස්සුත් එක්ක කතාවට ගිහිල්ලා ඇති සෙතක් නෑ පුතා. ඔහු මට පහදා දුන්නේය. ඒ වුනාට මිනිහා විභාග සමත් වෙච්ච උගතෙක්නේ. මම කීවෙමි. කොච්චර උගත් උනත් මොකටද පුතා මේ තමුන්ගේ පපුවේ ගැහෙන හදවතේ බීම් එකේ රිද්මය හඳුන ගන්න බැරිනං. විභාගෙට කියවන්න තියෙන්නේ සීමිත පොත් පත් ටික විතරයි පුතා. ඒකට කියන්නේ උගත් කම. ඒත් දැනුමට කොච්චර පොත් කියවල තිබ්බත් තවත් පොත් කියවන්න වෙනවා. මැරෙනකම්ම එහෙමයි. ඒකට කියන්නේ බුද්ධිමත්කම. ඔය දෙක පටලෝගන්න එපා. ඔහු මට පහදා දුන්නේය.

අල්විස් අයියා අට සමත් පුද්ගලයෙකි. එහෙත් අකුරු ඇමුණුම් අංශයට ලැබෙන බොහෝ පොත්පත් ඔහු කියවන්නේ සංශෝධනය කරමිනි. බොහෝ මතක ශක්තියක් හා ඉවසීමක් ඇති අල්විස් අයියා බොහෝ ඇසූ පිරූ තැන් ඇති කලාව, දේශපාලනය සේම දහම් දැනුමින් ද පෝසත්ව සිටි පුද්ගලයෙකි. ඒ කාලයේ තිරගත වූ පාරදිගේ චිත්‍රපටයේ ගැඹුරු දේශපාලන විග්‍රහය පිළිබඳව අප දෙදෙනා සංවාද කළ අයුරු මට අදටත් මතකය. කිසිම දේශපාලන පක්ෂයකට ගැතිකම් නොකල ඔහු මධ්‍යස්ථ දේශපාලන මතධාරියෙක් ලෙස තම අදහස් නොබියව නොපැකිලව ප්‍රකාශ කලේය. එහෙත් ඔහුට අධ්‍යාපන සහතික තිබුණේ නැත. එහෙත් දැනුමින් මෙන්ම අදහස් ප්‍රකාශනය තුලින්, ඔහු විශ්ව විද්‍යාල ආචාර්යවරයකු මෙන් සන්නද්ධව සිටියේය.

"අපේ මුතුන් මිත්තෝ විශ්ව විද්‍යාලවල ගිහිල්ලා අධ්‍යාපනයක් ලබපු මිනිස්සු නෙවෙයිනේ පුතා. ඒ වුනාට වාරි කර්මාන්තය, කලා ශිල්පය, කෘෂි කර්මාන්තය අතින් අපි අදට වඩා කොච්චර පොහොසත් වෙලා සිටියද. බුද්ධදාස රජතුමා සත්තුන්ට බෙහෙත් කළේ පශු වෛද්‍ය උපාධියක් අරගෙනද ? එතකොට ඔය සීගිරිය අවුකන සමාධි පිළිම නෙලපු උදවියගෙ දැනුම, මොකද ඉසුරුමුණියෙ පෙම් යුවලත් නෙලන්න අද හේවුඩ් ගිහිල්ලත් පුළුවන්ද ?" ඔහු ඉතිහාසය ගෙනහැර පාමින් බොහෝවිට අදහස් දැක්වූයේය. ඔහුගේ සමහර අදහස් මා පසු කලක මාගේ කෙටිකතා නිර්මාණ සඳහාද යොදා ගැනුනි. එහෙත් ඉන්පසු කිසි දිනෙක මගේ උගත් පැය අටේ මිතුරා සමග වාද කරන්නට ඔහු නොගියේය. බුද්ධිමත් කම හා උගත් කම ගැන සිතමින් මම දෙදෙනාටම සවන් දුන්නේය.

ඒ කාලයේදීම මුද්‍රණ සංස්ථාවේ චිත්‍ර අංශයට ආධුනිකයකු ලෙස පැමිණි ජයලත් මා හා බොහෝ සෙයින් මිතුරු විය. ඔහුට ඒ අධුනික වරම ලැබුනේ සහතිකවලට වඩා හැකියාවට තැන දුන් මගේම මිතුරකු එම පරීක්ෂණ මඩුල්ලේ සිටි නිසාය. ජයලත් අට සමතෙකි. එහෙත් ප්‍රාථමික පාසල් සමයේ ලංකාවේ මෙන්ම ජපානයේත් පවා රන් පදක්කම් දිනාගත් අති දක්ෂ ශිල්පියෙකු වූ ඔහු ජපානයෙන් ලැබුණු රන් පදක්කම විකුණා දුම්රියේ වඩේ වෙළෙන්දෙකු ලෙස ජීවිතය ආරම්භ කල පුද්ගලයෙකි. දැඩි මිතුරුකම නිසා සිය පෞද්ගලික ජීවිතය පිළිබඳව මා හා කතාබස් කළ ඔහු පවුලේ විස්තර අඩ දබර හා අකල් මරණයක් හිමි වූ තම මව පිළිබඳ කතා කලේ බොහෝ සංවේගයෙනි. එහෙත් කාලයක් දුම්රියේ වඩේ විකුණා තම සහෝදරියන් දෙදෙනා නඩත්තු කළ ඔහු නැවත චිත්‍ර ශිල්පියෙකු බවට පත් වූයේ මුද්‍රන සංස්ථාවේ දැන්වීමකට ආධුනික චිත්‍ර ශිල්පීන් තෝරාගත් පරීක්ෂණයක් නිසාය. අද වන විට ඔහු මුද්‍රණ සංස්ථාවේ පෙර සැලසුම් චිත්‍ර අංශයේ ප්‍රධානියා ලෙසින් කටයුතු කරයි. හැකියාව තුලින් ඉහලට ආ ජයලත් මෙවර කිසිදාක බලය හිමි නොවූ පක්ෂයක් හා සම්බන්ධ වෙමින් කටයුතු කරන දේශපාලක සත්වයකු බවට පත්ව ඇති බව මට ආරංචි වුණි. ගුණරත්න අපේ තරමක දුර ඥාතීත්වයක් ඇති මාමා කෙනෙකි. අපේ නිවෙස්වලට තරමක් දුරින් වාසය කළ ගුණරත්න මාමා කලා අංශයෙන් විශ්ව විද්‍යාලයට තේරී පත්වී ගුරුවරයෙක් ලෙස රැකියාව ආරම්භ කොට වැඩ දෙපාර්තමේන්තුවේ රාජකාරියට බැඳී අසූවේ ජූලි වැඩවර්ජනයේදී රැකියාව අහිමි වූ පුද්ගලයෙකි. ඔහු එයින් පසු තම දරු පවුල නඩත්තු කිරීමට අසීමිතව දුක් වින්දේය. අන්තිමේදී ඔහු කසිප්පු පෙරීමට පටන් ගත්තේය. ඒ කාලයේ ග්‍රාමීය හා කඳු වන ලැහැබයන්ගෙන් සපිරි ප්‍රදේශයක් වූ අපේ ගම ඔහුගේ ව්‍යාපාරයට කදිම තෝතැන්නක් විය. ඔහු සමග එකට අධ්‍යාපනය ලද ඉහල පොලිස් නිළධාරියෙකුගේ සහයෝගයද ඔහුට හිමි වූ නිසා එම ව්‍යාපාරය දියුණුවෙන් දියුණුවට පත්වූ අතර අසූවේ වර්ජකයකු සේ නැවත රැකියාව ලබා ගැන්මටද ඔහු උත්සාහ කළේ නැත. ඉන්පසු ඔහු තවත් කඩසාප්පු ඇතුලු ව්‍යාපාර කිහිපයක්ම ආරම්භ කළ අතර ජූලි වැඩ වර්ජනය ඔහුගේ යහපත දියුණුව වෙනුවෙන් සිදුවූවක් බව ඔහු විශ්වාස කළේය. කසිප්පු ව්‍යාපාරය අත්හල ඔහු පසුව බාර් ලයිසන් හිමි අධිපතියෙකු වූ අතර එදා තිබූ වාමාංශික අදහස් සිතින් නෙරපා බලයේ සිටින පක්ෂය වෙනුවෙන් අත දිගහැර වියදම් කරන ධනාවදී ලක්ෂණ පෙන්නුම් කළ, වාමාංශික පක්ෂ පිලිකෙව් කරන ව්‍යාපරිකයෙකු බවට අදවන විට පත්ව සිටි. එහෙත් ගමේ එදා දන්නා හඳුනන බොහෝ දෙනෙක් ඔහුව හැඳින් වූයේ කසිප්පු ගුණේ නමිනි. අදවින විට පිටස්තරයන් පමණක් නොව ඔහුම පවා ඔහුගේ අතීතය අමතක කොට දමා ඇත්තේය. එසේම ඔහු දැන් මුරණ්ඩු ඉක්මණින් කේන්ති ගන්නා තමනට ඇහුම්කන් නොදෙන සේවකයන්ට පවා පහර දෙන සූරා කන්නෙකු බවට පත්ව ඇත්තේ කාලයත් සමඟිනි. වරක් හා පළාත් සභාව වෙනුවෙන් බලයේ සිටි පක්ෂයකින් තරඟ වැදී පරාජය වී ඇත. එදා සිටි උගත් වාමාංශික අහිංසක ගුණරත්න ඔහු කෙරෙන් පලාගොස්, බලය මුදල් හමුවේ ඕනෑම දෙයක් කරන්නට පසුබට නොවන මෘගයෙකු බවට ඔහු පරිවර්තනය වී ඇත.

මේ හතරදෙනාම ජනතාව වෙනුවෙන් ඡන්දය ඉල්ලා සිටියහොත් ජනතාව ඡන්දය පාවිච්චි කරන්නේ කාටද? අද වන විට උගතුන් පාර්ලිමේන්තුවට යැවිය යුතුයැයි සමාජ වඩේ වෙළඳාමේ යෙදුණු පුද්ගලයෙකු මහ ඇමති කෙනෙතු වී දරුවෙකු පාසලකි අතුළත් කිරීමේ හේතුවෙන් දණ ගස්සවා දඬුවම් දුන් කාරණාවක් සම්බන්ධයෙනි. එහෙත් අප රටේ එවැනි දේ කරන්නේ නූගතුන් පමණක් දරුවෙකු පාසලට දමන්නට උගත් විදුහල්පතිවරයා ඉදිරියේ ලිංගික අල්ලස් වෙනුවෙන් දණගසන දෙමව්පියෝ කෙතරම් සිටීත්ද? ගැබිණි මවක් ඉදිරියේ හැසිරෙන උගත් විදුහල්පතිවරයෙකුගේ හැසිරීම මෑතකදී අප සමාජජාලා, වෙබ් අඩවි තුළින් දුටුවෙමු. එසේම අප රටේ වැඩියෙන්ම දූෂණය හා භීෂණයට හවුල් වී ඇත්තේ උගත් යැයි සම්මත නිළථාරීන්ය. මැති ඇමතිවරුන්ය. ඔවුන් නීතියෙන් රිංගා සාක්කි මකා දමමින් මහා පරිමාණයෙන් හොරකම් කරන අතර, නූගතා ඔවුන්ගේ පිහිටෙන් දූෂණයේ භීෂණයේ යෙදෙමින් නියමට කොටුවෙති. එසේම හොර උපාධි සහතික ඇතුළු අධ්‍යාපනික වට පිටාව තුළින් විභාග ගොඩයන උගතුන් කොතරම් සිටීද? බැඳුම්කර වංචාව ඇතුළු පසුගිය රජයේ මහා පරිමාණයේ හොරකම් සමඟ සිටියේ උගතුන් නොවේද? උගත්කම යනු අධ්‍යාපන සහතිකවලින් මනින මිම්මක් වී පාලකයන් තෝරාගන්නා රටකට අද ඇත්තේ ඛේදනීය අනාගතයකි. එනිසා අපරටට සුදුසු දේශපාලනයක් තෝරාගන්නා විට උගත්කම ඇතුළු තවත් බොහෝ දෑ ඔහු තුළ තිබිය යුතු බව ඡන්ද දායකයා වටහා ගන්නා තුරු අපට මේ වළෙන් ගොඩ ඒමක් නැත.